*සැ. යු.* - 2018.12.21 වැනි දින පළ වූ අංක 2103 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,104 - 2018 දෙසැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.12.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 606 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 ජනවාරි මස 18 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ජනවාරි මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/52156.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/DEV/04/NEL/345.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 232 ඞී, මැදගම ග්‍රාම නිලධාරී වසමේ මැදගම ගමේ අ. ග. පී. 481 දරන පිඹුරේ කැබලි අංක 409 න් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2867 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සඳහා බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 481 හි කැබලි අංක 404 සහ 411 ; |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 481 හි කැබලි අංක 411, 146, 140 සහ 410 ; |
| *දකුණට* | : | අ. ග. පි. 481 හි කැබලි අංක 410, 408, 140 සහ 146 ; |
| *බටහිරට* | : | අ. ග. පි. 481 හි කැබලි අංක 408 සහ 404. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

(අ) *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (2018.10.26 දින සිට ඉදිරියට);

*වාර්ෂික බදු මුදල* .- බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මකවන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර, එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය.

(ආ) බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

(ඇ) බදු ගන්නන් විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

(ඈ) සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

(ඉ) ප්‍රාදේශීය ලෙක්ම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

(ඊ) ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

(උ) 2018.10.26 දින සිට වසර 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක ;

(ඌ) බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

නුවනි සුදුසිංහ,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2018 දෙසැම්බර් මස 28 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, 'මිහිකත මැදුර'',
ඉඩම් මහලේකම් කාර්යාලයේ අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

12-889

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.